# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
# මාර්ග සංවර්ධන අධිකාරිය

## ලංසු ආරාධනයයි

### මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා සේවා සැපයීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) නිට්ටඹුව විධායක ඉංජිනේරු කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ නිට්ටඹුව විධායක ඉංජිනේරු කොට්ඨාසයට අයත් මීරිගම හා පූගොඩ වැඩ ඒකක සඳහා කුලී පදනම මත කියුබ් 01 ටිපර් රථ දෙකක් හා නිට්ටඹුව විධායක ඉංජිනේරු කොට්ඨාසයේ නඩත්තු කටයුතු සඳහා බැකෝ ලෝඩර් යන්ත්‍රයක් කුලී පදනම මත ලබාගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | විස්තරය | කාල සීමාව | නැවත ගෙවනු ලබන ලංසු සුරක්ෂණය |
|---|---|---|---|
| **RDA/EE/NIT/TEN/2023/50** | නිට්ටඹුව විධායක ඉංජිනේරු කොට්ඨාසයට අයත් මීරිගම වැඩ ඒකකය සඳහා කුලී පදනම මත කියුබ් 01 ටිපර් රථයක් සපයා ගැනීම. | වසර 01 | රු.10,000.00 |
| **RDA/EE/NIT/TEN/2023/51** | නිට්ටඹුව විධායක ඉංජිනේරු කොට්ඨාසයට අයත් පූගොඩ වැඩ ඒකකය සඳහා කුලී පදනම මත කියුබ් 01 ටිපර් රථයක් සපයා ගැනීම. | වසර 01 | රු.10,000.00 |
| **RDA/EE/NIT/TEN/2023/52** | නිට්ටඹුව විධායක ඉංජිනේරු කොට්ඨාසයේ නඩත්තු කටයුතු සඳහා බැකෝ ලෝඩර් යන්ත්‍රයක් කුලි පදනම මත ලබා ගැනීම | වසර 01 | රු.10,000.00 |

02. ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියේ නිට්ටඹුව විධායක ඉංජිනේරු කාර්යාලයයි.

03. ජාතික තරගකාරී ලංසු ක්‍රමය (NCB) අනුගමනය කරනු ලැබේ.

04. 2023.10.10 සිට 2023.10.31 දක්වා පෙ.ව 9.00 සහ ප.ව. 4.00 අතර කාලය තුළ නැවත ගෙවනු නොලබන රු.1,150.00 (වැට් සහිත) අයදුම්පත් ගාස්තුවක් කොන්ගස්දෙනිය ,

නිට්ටඹුව ලිපිනයේ පිහිටි විධායක ඉංජිනේරු කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සම්පූර්ණ ලංසු ලේඛන කට්ටල මිලදී ගත හැකිය. ලංසු ලේඛනය මිලදී ගන්නා විට මුල් ගෙවීම් පත්‍රිකාව ඉදිරිපත් විය යුතුය. 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත අනුව අයදුම්කරුවන් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටිය යුතුය. 2023.10.31 දින පෙ.ව 11.00 ට ලංසු භාරගැනීම අවසන් වේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම විවෘත කෙරෙනු ඇත. ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

05. ලංසු, 2024.01.02 දින දක්වා වලංගු විය යුතුය.

06. කොන්ගස්දෙනිය, නිට්ටඹුව ලිපිනයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලය වෙතින් රාජකාරී වේලාව තුල ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

07. මුදා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව සභාපති , ප්‍රසම්පාදන කමිටුව, විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය නිට්ටඹුව වෙත අවසන් දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදී ලැබීමට සැලැස්විය යුතුය. කරුණාකර සෑම ලංසුවකම ඉහල වම් කෙළවරේ ටෙන්ඩර් අංකය හා ටෙන්ඩර්යේ නම සදහන් කල යුතුය. සෑම ලංසුවක් සඳහා දක්වා ඇති වටිනාකමට නැවත ගෙවනු ලබන ලංසු සුරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය රහිතව ඉදිරිපත් වන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. වැඩි දුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 033 2245965 ඔස්සේ කාර්යාල වේලාවන්හීදී මාර්ග සංවර්ධන අධිකාරයේ නිට්ටඹුව විධායක ඉංජිනේරු කාර්යාලය, අමතන්න.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
විධායක ඉංජිනේරු කාර්යාලය
මාර්ග සංවර්ධන අධිකාරිය
නිට්ටඹුව